# දරුවාගේ මානසික පෝෂණය

(පසුගිය කලාපය හා සම්බන්ධයි)

ආචාර්ය
**ත්‍රිලෝක සුන්දරී කාරියවසම
විසිනි.**

සෙල්ලම් කිරීමෙන් ළමයා නොමග යන බවට විස්වාස කරන වැඩි හිටියෝ සිටිති. කුඩා දරුවා ගේ සාමාජීය අනුගත වීම වැඩි දියුණු වීමට හේතු වන නිසා බුද්ධි වර්ධනයට එම ක්‍රීඩා ඉතා වැදගත් වේ. පිරිසිදුව ඇඳ පැළඳ දරුවා තමාගේ සෙල්ලම් බඩුවක් සේ තබා ගන්නා මව්වරුන් සිටිති. එමෙන් ම සෙල්ලම් බඩු පරිහරණය කිරීමට නොදී ආරක්ෂා කරන මව්වරු ද සිටිති. එසේ කිරීමෙන් ළමයාගේ නිර්මාණාත්මක හැකියාව සියයට 30 ක් පමණ අඩුවන බව පරීක්ෂණ වලින් පෙන්නුම් කරයි.

වැඩි වයසට පත්වන තුරුම කෑම කවන, ඇඳුම් අන්දවන, බසයට නංවන අතේ එල්ලා ගෙන යන මව්වරු වෙති. ළමයාගේ බුද්ධි නිෂේධනය කෙරෙහි මෙය බලපායි. වයස වැඩි වනවාත් සමඟම දරුවාට නිදහස්ව අත් දැකීම් ලබා දිය යුතුයි.

ළමයා තුළ නව ආශාවන් වර්ධනය කිරීම වීර අත් දැකීම් ලබා ගැනීමේ මාර්ගය වන්නේය. ක්‍රීඩාවේ යෙදීමට, ගස් යැමට, චිත්‍ර ඇඳීමට ආදී වශයෙන් ඇති කරන ආශාවන් වැඩියෙන් ළමයාගේ මනස ප්‍රබෝධමත් කරයි. දැනීම ලබා ගැනීම ද අවශ්‍යතාවන් සම්පූර්ණ වීමේ මාර්ගයක් වන බව කලින් ද දැක්වීමු. ප්‍රශ්න ඇසීමට තරම් කථාවේ නුපුහුණු බිළිඳු නොයෙක් දේ පිළිබඳව කරුණු දැන ගැනීමට හෝ ඇසීමට වුවමනාවක් දක්වන අවස්ථා අප දැක ඇත. ප්‍රශ්නයක් නැගීමට තරම් වචන මාලාවක් ඇති හෝ කථා කිරීමට පුළුවන් ළමයා නොයෙක් ප්‍රශ්න නගන්නේ දැනීම ලබා ගැනීමට ය. ළමයා තම අභිමුඛයට එන ඕනෑම දෙයක් ස්පර්ශ කිරීමට හෝ ඇල්ලීමට කැමැත්තක් දක්වයි. එසේ කිරීමෙන් දැනීම ලබාගනී. වීර අත් දැකීම් ලබා ගනී.

ලෝකයේ විදුලිය හා සම්බන්ධ සොයා ගැනීම් කළ තෝමස් එඩිසන් නමැති විද්‍යාඥයාගේ ළමා ජීවිතය කෙරෙහි මෙහි දී සිත් යොමු වෙයි. ඔහු කුඩා කළ පාසල් ගොස් ගෙදර පැමිණි විගස ඇඳුම් පැළඳුම් මාරු කොට ගෙදරින් පිට වී යැමට පුරුදුව සිටියේය. තම පුතා පැසැලින් ගෙදර පැමිණි විගසම මේ යන්නේ කොහාට දැයි විමසිල්ලෙන් සිටි මව දිනක් තම ගෘහය අසළ පිහිටි පිදුරු මඩුවවට ඔහු යන බව දැක්කාය. මඳ වේලාවකින් එතැනට ගිය මව දක්නනට ලැබුණේ උත්කූටුකයෙන් සිටි එඩිසන්ය. "පුතා ඔබ කුමක් කරන්නේ දැයි" යි මව ඇසීය. "මම බිජු රකිමි" යි උත්තර දුන්නේ කිකිළියන් විසින් පිදුරු මඩුවේ දමා ගිය බිත්තර මත වාඩි වී සිටි එඩිසන් ය. මෙහිදී ඔහුට වුවමනා කළේ නව අත්දැකීම් ලබා ගැනීමටය. අළුත් දෙයක් ඉගැනීමට ය. මේ ආදී වශයෙන් සෑම බිළින්දෙක් ම පසු කාලයක එඩිසන් ගේ තත්ත්වයට නො පැමිණියත් අළුත් දේ ඉගැනීමෙන් වීර අත්දැකීම් ලබා ගැනීමට වුවමනාවක් දක්වන්නේ ය.

කුතුහලයත් අලුත් දේ ඉගෙනීමට හෝ වීර අත්දැකීම් ලබා ගැනීමට උදව් වේ. ළමයා තම අභිමුඛයට එය ඕනෑම දෙයක් ඇල්ලීමට හෝ ස්පර්ශ කිරීමට කැමතිය. මුඛයේ දැමීමට කැමතිය. ඒ කැමැත්ත ස්වභාවිකය. ඒ මාර්ගයෙන් ඔහු නොයෙක් කරුණු සොයා ගනිය. වීර අත්දැකීම් මාර්ගයෙන් ළමයා අපේක්ෂාවන් මුදුන්පත් කර ගන්නේ ය. ඉන් ඔහු වෙත තෘප්තිය ලඟා වෙයි. ගලක් උඩට නැගීමට උවමනා කරන ළමයා ඒ මත නැගීමෙන් මානසික ප්‍රීතියක් ඉන් වින්දේය. ළමයා කැමති සෑම දෙයක් කිරීම මෙයින් අදහස් නො කෙරේ. පඩි පෙළක ඇති උස් මාලය දරුවාට ආරක්ෂක වීමට ගේට්ටුවක් දැමිය හැක්ය. අපේක්ෂාවෙන් මුදුන්පත් කර ගැනීම සුරක්ෂිතය භාවය ලඟාකර ගැනීමේ මාර්ගයකි. වීර අත් දැකීම් නො ලබා පෞරුෂත්වය වර්ධනයට අහිතකරය. චරිත සංවර්ධනයට හානිකරය. බාලාපචාරීන් නොයෙක් විට සොරකම් කිරීමට පෙළඹෙන්නේ සොරකම් කරන භාණ්ඩය හෝ මිල මුදල් ලබා ගැනීමට නොව වීර අත්දැකීම් ලබා ගැනීමට ය. එවැනි අවස්ථා ඇති වන්නේ කුඩා කාලයේ සිට අත් දැකීම් නොලැබුණු විට ය.

වගකීම ඉසිලීමට කුඩා ළමෝ වුවත් කැමති වෙති. වයස තුනේ හතරේ, ළමයා වුවත් තමන්ට පැවරෙන සමහර කාර්යයන් කිරීමට උනන්දුවක් දක්වයි. විශේෂයෙන් වැඩි හිටියන් විසින් කළ හැකි (ළමයින්ට වුව ද කළ හැකි) සමහර වැඩපළ කිරීමට වුවත් ළමුන් සතුටින් ඉදිරිපත් වන අවස්ථා තිබේ. මේ හයින් බලන කළ පුද්ගලයා වගකීම් ඉසිලීමට වුවමනාවක දක්වන්නේ කුඩා කළ, සිටය. ද්‍රව්‍ය හෝ භාණ්ඩ පිළිබඳව සහ පුද්ගලයින් පිළිබඳ වගකීම් ඉසිලීමට ළමයා කැමතිය. මේ වගකීම් වර්ග ද්වයම ළමයා අවශ්‍යයෙන් ම ඉසිලිය යුතුය. ප්‍රථමයෙන් ම ළමයා තුළ වගකීමට ඇති අවශ්‍යතාව නොයෙක් දේ හිමිකර ගැනීමේ හෝ සතුකර ගැනීමේ වුවමනාවන්ට වඩා තදින් ඇති වේ. යමක් තමාට ම අයිති බවත්, එසේ තමාගේම යයි යන හැඟීමෙන් ඇති වීමත් නිසා ඔහු එක්තරා වගකීමක් ඇති කර ගන්නේ ය.

නොයෙක් දේ එකතු කිරීමට සහ හිමිකර ගෙන සිටීමට ළමයාට ඉඩ සලසා දිය යුතුය. ඇඳුම්, පැළඳුම් පොත් පත්, මේවන් ඒවා තබා ගැනීමට සුදුසු ස්ථානයක් ළමයාට තිබීම වැදගති. එමෙන්ම රම්‍යාභ්‍යාසයන් ඇති කර ගැනීමට අවස්ථා සැලසීමත් මේ සඳහා වැදගත් වන්නේ ය. බස් ටිකට් එකතු කිරීම්, මුද්දර එකතු කිරීම ඊට නිදසුනකි. දේපළ සහ වස්තුවට ගරු කිරීම මෙන්ම ඒවායේ වටිනාකම අවබෝධ වීමට ඇති ඒකායන මාර්ගය නොයෙක් දේ එකතු කිරීමට ඉඩ සැලසීයම තමාගේ අයිතිවාසිකම් වලට මෙන් ම අන්‍යයන්ගේ අයිතිවාසිකම් වලටත් ගරු කිරීමට පටන් ගන්නේ මේ ආකාරයෙන් ය. බොහෝ විට අන්‍යයන්ගේ දේ සොරකම් කිරීමට ඉදිරිපත් වන්නේ වගකීම පෙන්වීමට තමන් සතුව කිසිවක් නොතිබුණ අයය. බාලාපචාරීන් බොහෝ දෙනකුට වගකීමේ මානසික අවශ්‍යතාව සම්පූර්ණ

(28 වෙනි පිටුව බලන්න)

# දරුවාගේ මානසික......

(24 වැනිපි ටුවෙන්)

කිරීමට අවස්ථාව නො තිබුණු බව ඔවුන්ගේ අතීත වාර්තා වලින් පෙනේ. අන්‍ය යන්ගේ දේ විනාශ කිරීමට ද ඉදිරිපත් වන්නේ මෙවැනි අවශ්‍යතාවන් අසම්පූර්ණ වූ විට ය.

වගකීම පැවරිය යුත්තේ ඉතාම පරික්ෂාකාරීවය. ළමයාට ඉසිලිය හැකි වගකීම් ඔහු වෙත පැවරිය යුතු වන අතර ඉසිලිය නො හැකි වගකීම් නිසා ඇතිවන මානසික පීඩනය ළමයාගේ මානසික සෞඛ්‍යයට එරෙහි ව සිටී. වගකීම ඔහුගේ වයසට උචිත විය යුතුය. වගකීම ඉසිලීමට සමත් වීමෙන් ළමයා තුළ සුරක්ෂිත භාවය ද ඇති වෙයි. එමෙන්ම ඔහුගේ ශක්තිය අවබෝධ කර ගැනෙයි ළමයා වෙත වගකීම් පැවරීම් ඔහු අන්‍යයන් විසින් පිළිගනු ලබන බව දැක්වීමට යහපත් මාර්ගයකි. පිළිගැනීම හා වගකීම ඉසිලීමට ඒ තැනැත්තා තුළ ඇති ශක්තිය අවබෝධ වීමෙන් පසුවය. මේ නිසා එම වගකීම පැවරෙන තැනැත්තා එය ක්‍රමවත්ව ඉසිලීමට උනන්දුවක් හා උවමනාවක් දක්වයි. මේ නිසා තව තවත් ක්‍රියාශීලී ඩිවන්නේය. යම් යම් කාර්යයන්හි දී ළමයාගේ අදහස් උදහස් වීම සහ ඒවාට ගරු කිරීම ළමයාට වගකීම ලබා දීමක් වන්නේය. ඔහුගේ අදහස් ප්‍රකාශ කරන විට ඒවා නො පිළිගැනීම හෝ ඒ නිසා ඔහු පරිභවයට ලක් කිරීම ඉච්ඡාභංගත්වයක් ඇති කිරීමට හේතු වේ.

උගත් මවක් දරුවකුට සම්පතකි. අප රට ද වෙනත් රටවල ද කර ඇති පර්යේෂණ අනුව පෙන්නුම් කරන්නේ උගත් මව්වරුන් බෙහෝ සේ දරුවාගේ කායික, මානසික, චිත්තවේගීය සමාජයීය සංවර්ධනයට හේතු වන වෙයි. උගත්භාවය ලබා නො ගත් කාන්තාවන්ට මෙම දැනීම අවිධිමත්ව ලබාගත හැක. ජන සමාජයේ වගකීම අවිධිමත් අධ්‍යාපනය මගින් මෙම දැනුම කාන්තාවන්ට ලබා දීම ය.

---

## කොම්පෝස්ට්. . . .

(13 වැනි පිටුවෙන්)

කාබනික ද්‍රව්‍ය පොහොර කොපමණ ප්‍රමාණයක් යෙදිය යුතුදැයි නිශ්චිතව, තීරණය කිරීම තරමක් අපහසු නමුත් දළ වශයෙන් සෑම වර්ග මීටර 2 ක බිම් ප්‍රමාණයට කූඩයක් යෙදීම හෝ පැළ සිටුවීමේදී වළකට පෝර කූඩා 1/3 ක් යෙදීම සෑහේ. වළවල් පිරවීම සඳහා ඉන්ද්‍රියවත් පෝර භාවිත කරන්නා වූ අවස්ථාවලදී, එම ද්‍රව්‍ය මතුපිට පස් සමඟ මිශ්‍ර කර පොළොව මට්ටමින් උස්ව සිටින සේ පිරවීම් කළ යුතුය. දින කීපයකින් මෙසේ පිර වූ පස් තැන්පත් වේ. ඉන් පසු පැළ සිටුවීම කළ යුතුය.